දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි ප්‍රථම භාග (බාහිර) පරීක්ෂණය - 2014 පෙබරවාරි/මාර්තු
Bachelor of Arts Degree (External) Part I Examination - February/March 2014

භූවිසා 2.1 - සම්පත් සංවර්ධනය හා සැලසුම්කරණය
GYG 2.1 - Resource Development and Planning

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

---

01. "වර්ධනය වන අවශ්‍යතා සහ හැකියාවන් මත සම්පත් කෙරෙහි ඇති මානව ඇගයුම පුළුල් වේ." උචිත නිදසුන් දක්වමින් විමසන්න.

(ලකුණු 20)

02. ජනසංඛ්‍යාව වයස්ගත වීම (Population Ageing) හේතු කොට ගෙන ශ්‍රී ලංකාවේ මානව සම්පත් පැතිකඩ ආශ්‍රිත ව පැන නැගෙමින් පවත්නා අභියෝග උචිත දත්ත ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

03. "සම්පත් පරිහරණය පිළිබඳ පරිසර විද්‍යාත්මක දෘෂ්ටිකෝණය" පැහැදිලි කොට, සම්පත් සංරක්ෂණයෙහි ලා එමගින් ලබා දෙන දායකත්වය සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

04. යම් ප්‍රදේශයක් සංවර්ධනය කිරීම සඳහා එම ප්‍රදේශයේ පවත්නා සම්පත් (ස්වාභාවික, මානව) හඳුනා ගැනීමේ කාර්යය ඔබ වෙත පැවරී ඇතැයි සිතන්න. එහි දී ඔබ විසින් අවධානය යොමු කරනු ලබන කරුණු සැකෙවින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

05. ලොව වැඩි ජනගහනයක් වාසය කරන තුන්වැනි ලෝකයේ රටවල වනාන්තර සම්පත ශීඝ්‍ර ලෙස අඩු වීමට හේතු පැහැදිලි කොට, වනගහනය අඩුවීම නිසා ඇති වී තිබෙන අහිතකර ප්‍රතිවිපාක නිශ්චිත නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

06. ගෝලීයව ආහාර මිල ඉහළ යාම බලශක්ති මිල ඉහළ යාමේ ප්‍රතිඵලයක් ද? ඔබේ පිළිතුර සනාථ කිරීමට නිශ්චිත සංඛ්‍යා දත්ත හා තොරතුරු ලබා දෙමින් විග්‍රහ කරන්න.

(ලකුණු 20)

07. ගෝලීයව ජල අර්බුදයට හේතුව ජල හිඟයද නැතහොත් ජල පරිභෝජනයේ ඇති විෂමතා ද? යන්න උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

08. වත්මන් ගෝලීය පරිසරය තුළ තිරසර සංවර්ධන සංකල්පය විද්‍යමාන වන්නේ ද? ඔබේ පිළිතුර කුමක් ද? එය, නිශ්චිත හේතු දක්වමින් සනාථ කරන්න.

(ලකුණු 20)

*************************